# මා හිතවත් ජගත්.......

මේ සටහන කෙළෙසින් කොතැනින් මුල පිරිය යුත්තක්දැයි නො දනිමි. කෙසේ වුව ම'විසින් කළයුතුව ඇති දෙයක් වගනම් දනිමි. නුඹ පිළිබඳව සටහනක් තැබීමට සුදුසු ඉඩක් සොයමින් ම සිටි මට මේ ඊට සුදුසුම වෙලාවයි.

මා හිතවත් ජගත්, ජගත් එදිරිසිංහ. මීට කලින් මා සටහන් ලිවීමට ඉඩ සෙවූයේ නුඹගෙ ගී පද රචනාවක් පද අතරිනි. තවත් විටෙක කවි පෙළක වචන අතරිනි. තවත් විටෙක නුඹගෙ නවකතාවක පිටු අතරිනි. එහෙත් ? එහෙත් නුඹ ම මට එරෙහි වූවෙහි ය. "මොකට ද මචං අපි ගැනම ලියා ගන්නෙ ?" නුඹ අවි අමෝරා ගත්තෙහි ය. මම නිහඬ වූයෙමි. නිරායාසයෙන් ම නුඹගේ නිර්මාණයක් පිළිබඳව ලියැවුණ ද මා ලැබූයේ ඉහත ප්‍රතිචාරයම යි. අයිතිවාසිකම් පසු පසම ලුහුබැඳ යන සමාජයක අපගේ යුතුකම කුමක්දැයි හඳුනාගත යුතුව ඇත්තේ ය. සරු දෙයක් ඇගයීම අපගේ යුතුකම නොවේ ද ? අද මා සටහන් තබනුයේ නුඹගේ නිර්මාණ පිළිබඳව නම් නොවේ. නුඹ මට දුන් දේ පිළිබඳවයි. එය මාගේ යුතුකමක් ලෙසින් මා දකින්නෙමි. "සන්නස" සංස්කාරක ධූරයේ බරින් නිදහස් වන්නට නුඹ තීරණය කළ මේ අවස්ථාව ඊට උචිතම අවස්ථාව යැයි හැගින්නෙමි.

අපගේ මුල් ම හමුව වර්ෂ 1981 - 82 තරම් ඈතට දිවයයි. එකම කෙෂ්ස්ත්‍රයකට යොමුවූවන් ලෙසින් ඒ. ඊට අමතරව අපරදිග වාද්‍ය කණ්ඩායමක ගිටාර් වාදකයෙකු ලෙසින් නුඹ පිළිබඳව සිහින් මතකයක් ඇත්තේය මට. කවි ලියූ බව, කවි පොත් ලියා පළ කළ බව අසා තිබිණ. ඒ හැම මතකයකටම සබැඳියාව වූ නිමල් අබේසේකර සොයුරා ද සමගින් නුඹ මා පිළිගන්නට මෙල්බර්න් ගුවන් තොටුපළට පැමිණ සිටියේ මාගේ පවුලේ උදවිය පැමිණෙන්නටත් පෙරයි. එදා නුඹගේම කැමරා කාජයේ සටහන් වූ සිතුවම් අද ද මගේ මතකය අවදි කරවයි.

මා හිතවත් ජගත්, මා මෙල්බර්න් නගරයට ආවේ මව් කුසින් දරුවෙකු මෙලොවට පැමිණෙන්නා සේ හිස් අතිනි. එහෙත් මව්ගෙන් දරුවෙකුට ලැබෙන රුහිරයෙහි කැටි වුණ උණුහුම, සරුබව කෙරෙහි නුඹට වූ "ඉව" පිළිබඳව මම සාඩම්බර වන්නෙමි. මව් බිමෙත් මගේ ලෙයට මුහුවූ දෙයක් විණි නම් එය උකහා ගන්නට නුඹට හැකිවිණැ'යි මම සිතමි.

මා හිතවත් ජගත්, මා පුවත්පත් කලාවේදියෙකුනම්, ඒ දේ කළේ නුඹයි. පාසැලේ දී ඈදි ශිෂ්‍ය සංගම්වලදී ඊට මුල පුරා තිබුණ ද වෘත්තියට අමතරව මාගේ ලෝකය වූයේ ගීත කලාව හා චිත්‍ර කලාවයි. "උඹට ලියන්නත් පුලුවන් කියලා අපි දන්නේ දැන්නේ." ඕනෑම දෙයක් සෘජුවම කියන ලේක්හවුස් ආයතනයේ ජ්‍යෙෂ්ඨ කතුවරියක වන මාගේ වැඩිමල් නැගනිය එලෙසින් සහතික දුන්නේ මට නොවේ; නුඹටයි.

වරුණ සාවින්ද සොයුරාත් සමගින් නුඹ මා කැන්දාගෙන ආ "පහන" ගමන් මග අදටත් සුන්දර අතීතයකි, මට. නුඹගේ එකම දුරකථන "විධානයකින්" "සන්නස" පුවත්පතේ මුල්ම ලිපිකරුවා වූයෙමි මම. සිංහල අවුරුද්ද වෙනුවෙන් අඳින ලද සිතුවමක් ද සමගින් "සන්නස" තුන්වන පිටෙහි පළවූ ඒ ලිපිය මගේ "සන්නස" ලිපි එකතුවේ ද පළමුවැන්නයි. විනී හෙට්ටිගොඩගේ ආරයට මෙරට අපේ පුවත්පතක මුල් වතාවට කාටූන් චිත්‍ර පෙළක් "කෑමට පසු" නමින් ඇඳීමට උනන්දු කළේ ද නුඹයි. පුද්ගල ඡායාරූප :ඡදරඑර්සඑ* ඇඳිමේ හැකියාව පිළිබඳ දැනී "ගී සඳළුව" ලිපිය සම්පාදනය කිරීමට අදට ද උනන්දු කරවන්නේ නුඹයි. මෙකී සියල්ලටම වඩා නුඹ ලබා දුන් අසීමිත නිදහසයි මා ලද වටිනාම සම්පත.

**කමතක කොල පාගන අම්බරුවන් සේ එකම රවුමක යායුතු නොවේ නිර්මාණකරුවන්. කෙවිටි කළ යුතුද නොවේ ඔවුනට. ඒ නිසාවෙන් නුඹ ධූරයෙන් ඉවත්වීම පිළිබඳ එරෙහිවිය නොහැකිය මට. එහෙත් එක් හේතුවක් නිසාවෙන් නෙත් කෙවෙනි තෙත් වෙයි. ඒ උණුසුම කඳුල හුරු නුඹට ද නුඹගේම කඳුලකින් දැනෙනු ඇත.**

---

පියාගේ උරුමයෙන් දෝ ජන්මයෙන් මා ලද නිදහස් චින්තනය වැදූ මවටවත් වෙනස් කළ නොහැකි විය. හැකි වූයේ නො දරු වියේදී, තාරුණ්‍යයේ දී පාලනය කිරීමක් පමණෙකි. එහෙත් පාසැලින් හා මිතුරුන්ගෙන් ඒ දේ ඔපමට්ටම් විණ. එවන් එකි මිතුරෙකි නුඹ මට. " නිර්මාණකරුවකුගේ " නිදහස් පවෙහි වටිනාකම් දත්තකු ලෙසින් නුඹ මට නිදහස දුන්නෙහිය. "සන්නස" පිරිවරෙහි සිටිමින් ම අනෙක් පුවත්පත්, සඟරාවලට ලිවීමට ඉඩකඩ ලබා දීම පූර්වාදර්ශයක් ලෙසින් මම දකිමි. යම් කාර්යයක දී කණ්ඩායම් හැඟීම අවශ්‍යමයි. එහෙත් එය කල්ලිවාදියක් නොවිය යුතුයි. ඒ පිළිබඳව නුඹ වෙත වූ ධනාත්මක අදහස් මම අගයන්නෙමි. "පන්හිඳයි පින්සලයි" ලිපිය සම්පාදනයේ දී මා ලද අසීමිත නිදහස ඉහළින් ම අගයන්නෙමි මම.

මේ ගමනේ දී හැලහැප්පුණෙමු අපි. ඒ නිවැරදි දේ වෙනුවෙනි. මව්බිමේ කැළණි මිටියාවත ගම් පියස වූ මට නුඹ කැළණි ගංගාවේ මුහුකුරා ගිය අවධියයි. කඩුවෙල පාළම අසලදී එහි ගැඹුර, ධරණීතලයට සම්පතකි. නුඹ කැළණි ගංගාවේ කඩුවෙලයි. එසේ නම් මා ? කිතුල්ගල ප්‍රදේශයේ ගල්කුලු අතර හැපෙමින් කඩුවෙලට ළඟාවෙන්නට තතනන කැළණි ගං දරුවායි. තැම්පත් නුඹ මාගේ කැළඹුම් ස්වභාවයන් පසු-ගිය වසර පහ පුරාවට ඉවසුවෙහිය. එය මා ලද ආශිර්වාදයක් කොට සිතන්නෙමි.

සංස්කාරක ධූරයෙන් ඉවත්වන්නට ප්‍රථම නුඹ මාගෙන් ඉල්ලීමක් කළෙහිය. නව සංස්කාරකවරයාටද තමන්ට සේම සහයෝගය දෙන ලෙසටයි ඒ. එය ඉවතලිය නොහේ. මා-ගේ මව්නටවත් වෙනස් කළ නොහැකි වූ මාගේ නිදහස රැකෙන තාක් කල් මාගේ උපරිමය දායද කිරීමට සපථවන්නෙමි මම. කමතක කොල පාගන අම්බරුවන් සේ එකම රවුමක යායුතු නොවේ නිර්මාණකරුවන්. කෙවිටි කළ යුතුද නොවේ ඔවුනට. ඒ නිසාවෙන් නුඹ ධූරයෙන් ඉවත්වීම පිළිබඳ එරෙහිවිය නොහැකිය මට. එහෙත් එක් හේතුවක් නිසාවෙන් නෙත් කෙවෙනි තෙත් වෙයි. ඒ උණුසුම කඳුල හුරු නුඹට ද නුඹගේම කඳුලකින් දැනෙනු ඇත. නුඹ අල්ලපු වැටේ පදින්චිව සිටිය ද සංස්කාරකවරයා වශයෙන් වූ සබැඳියාව ගිලිහී යාමයි ඒ හේතුව. කෙසේ වුවද නුඹ "සන්නස" පිරිවරේ සිටීම සිතට සහනයකි.

සිසිර දිසානායක

